මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ ලේකම් කාර්යාලය, අංක 02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

LAE\2023\26

2023.01.26

මැතිවරණ කොමිෂන් සභාවේ සභාපති ඇතුළු සාමාජිකයන් ඉල්ලා අස්වී ඇති බවට සහ කොමිෂන් සභාවේ එක් සාමාජිකයකුගේ ඉල්ලා අස්වීම ජනාධිපති කාර්යාලය වෙත යොමු කර ඇති බවට ද වූ ප්‍රවෘත්ති ජනමාධ්‍ය තුළින් ප්‍රචාරය වී ඇත. මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජිකයකුගේ ලිඛිත ඉල්ලා අස්වීමක් හෝ එසේ යවන ලද ලිපියක පිටපතක් හෝ මේ දක්වා මැතිවරණ කොමිෂන් සභාව වෙත ලැබී නොමැති අතර, සභාපතිතුමා ඇතුළු සාමාජිකයන් මැතිවරණ කොමිෂන් සභාවේ ව්‍යවස්ථාපිත කාර්යයන් හා 2023 පළාත් පාලන ඡන්ද විමසීමට අදාළ කාර්යයන් කිසිදු අඩාල වීමකින් තොරව සැලසුම් කර ඇති ආකාරයට ක්‍රියාත්මක කරනු ලබන බව ද මෙයින් නිවේදනය කරමි.

කොමිෂන් සභාව කෙරෙහි ජනතාවගේ විශ්වාසය පළුදු කිරීමේ අරමුණින් මෙවැනි අසත්‍ය ප්‍රචාර වරින් වර නිර්මාණය කොට ප්‍රචාරය කරනු ලබන බව කොමිෂන් සභාවට නිරීක්ෂණය වී ඇති බව ද වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

මැතිවරණ කොමිෂන් සභාවේ නියමය පරිදි,

එච්.එම්.ටී.ඩී. හේරත්
ලේකම්
මැතිවරණ කොමිෂන් සභාව